# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2337/27 - 2023 ජූනි මස 23 වැනි සිකුරාදා - 2023.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.-බී 5/85(iii)

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත**

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 27, 28 සහ 30 වන වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 61 වන වගන්තිය යටතේ කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජූනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 ජූලි 6 වන දින අංක 1765/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත, 1985 අගෝස්තු 28 වන දින අංක 364/9 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද, 1985 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ නියෝගවල 2 වන නියෝගයේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

''(ආ) එම ස්ථානය ම සම්බන්ධයෙන් වූ බලපත්‍රය අලුත් කරන එක් එක් අවස්ථාවක් සඳහා රු. 100,000.00''

EOG 06 - 0179/1

1A - G 39756— 07 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එල්.ඩී.-බී 5/85(iii)

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත**

51 වන වගන්තිය යටතේ වන නියමය

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 51 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, මේ නියෝගය මගින්, ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලබන්නාවූ ද, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති සේවා නියුක්ති කාණ්ඩයට අයත් වන්නා වූ ද, සෑම තැනැත්තකු විසින් ම ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කර ඇති මුදල කාර්යාංශයට ගෙවිය යුතු බව නිශ්චය කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජූනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| (අ) සේවා නියුක්තයා සේවායෝජකයකු සමඟ පළමු වරට ගිවිසුමකට එළඹ ඇත්තා වූ කාණ්ඩය | රු. 18,000/- (අදාළ බදුවලට යටත්ව) |
| (ආ) සේවා නියුක්තයා එකම සේවායෝජකයකු සමඟ දෙවන හෝ තදනන්තර වරට සේවා ගිවිසුම අලුත්කර ඇත්තා වූ කාණ්ඩය | රු. 3,600/- (අදාළ බදුවලට යටත්ව) |

1995 සැප්තැම්බර් 1 වන දින අංක 887 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, ඉහත සඳහන් පනතේ 51 වන වගන්තිය යටතේ කරන ලද නියමය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

EOG 06 - 0179/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.